සෙරන්ඩිබ් ලංකා ට්‍රැවල්ස්

COLOMBO from £460+TAX
INDIA from £345+TAX
FAREAST from £375+TAX

මව් බිමට යන ඔබට ගුවන් ටිකට්පත් අපෙන්
ගුවනින් හෝ මුහුදින් වඩාත් සුරක්ෂිතව භාණ්ඩ ප්‍රවාහනය
කාර්යක්ෂම සුහදශීලී සේවාව
OI, Olympic Way, Wembley,Middlesex,HA9 ONP
Tele:-0800 612 1180
Fax:- 0208 782 1134
Lal: 077 918 92887 Amila: 077 381 80965
info@serendib-lanka.com

# ලංකාවේ ගබ්සා මධ්‍යස්ථානය ලෙස කුරුණෑගල ප්‍රසිද්ධයි

අළුත්ම පොලිස් වාර්තා අනුව කුරුණෑගල නගරය ලංකා ගැහැණුන්ගේ ගබ්සා මධ්‍යස්ථානය බවට පත්ව ඇත. ඒ අවට ඇති කෑගල්ල නිකවැරටිය ගලිගමුව හා මාවනැල්ල ආදී පළාත් ප්‍රධාන ශාඛා වශයෙන් ඊට සම්බන්ධය.

කුරුණෑගල යනු අනුරාධපුරයට පසු හමුදා සේනාංක මාරුවන ප්‍රධාන ස්ථානය වන අතර වෙළඳ ව්‍යාපාර අතින්ද කොළඹ තරමටම ප්‍රසිද්ධියක් උසුලයි. පාසැල් ටියුෂන් පංති සඳහා ද එය මුල් තැනක් ගනී. මේ සියළු කරුණු ද ගබ්සා ව්‍යාපාරය නැග යාමට හේතු වී ඇත.

මෙම නීතිවිරෝධී ගබ්සා මධ්‍යස්ථාන පොලීසියෙන් වටලන නිසා මේවා අයිතිකරුවෝ කුරුණෑගල අවට පළාත්වලට ගොස් ක්‍රියාත්මක වෙති.. ගබ්සාව වැරදී අසාධ්‍ය තත්වයෙන් කුරුණෑගල රෝහලට ඇතුල්වන කාන්තාවන්ගේ සංඛ්‍යාව ද ඉහළ ගොස් ඇති බව කියති.

**ගබ්සා මිළ දර්ශනය මෙසේය**

මාස 1 ක ගැබක් විනාශ කිරීමට රු 6000 යි.
මාස 2 ක ගැබක් විනාශ කිරීමට රු 8000 යි.
මාස 3 ක ගැබක් විනාශ කිරීමට රු 9000 යි.
ඉන් ගබ්සාකරුට ගෙවීම රු 3000 කි.
ඉතිරි මුදල සාප්පුව අයිති මුදලාලිට ය.

♦ පූර්නිමා විරසේකර - ඩෙලිමිරර්

# Sinhala Lesson 114 සිංහල පාඩම

## සිංහල ඉගෙනීමට පහසු මගක් !

**Translate following questions and answers into Sinhala and English as in a dialogue :**

**A.** What is the date today?
**B.** It is the 5th of December.
**A.** When will you go to the new school?
**B.** It may be in January next year.
**A.** How will you go there everyday?
**B.** Either I will go by bus or in uncle's car.

**A.** ඔයාගෙ උපන් දිනය කවදාද?
**B.** පෙබරවාරි 4 වෙනි දා.
**A.** උත්සවයක් පවත්වනවාද?
**B.** ඔව්! පුංචි උත්සවයක් පවත්වන්න බලාපොරොත්තු වෙනවා ගෙදර.
**A.** කාටද ආරාදනාකරන්නේ?
**B.** මගේ යාලුවන්ටයි අපේ පවුලේ ළඟම නෑයින්ටයි යාලුවන්ටයි.

You can extend these dialogues in writing and / or practise orally with another person. You will find a variety of Sinhala vocabulary in my book **Practical Sinhala for Biginners.**

♦ ආචාර්‍ය සුභද්‍රා සිරිවර්ධන
Dr Subhadra Siriwardane

# Remembering Para සාදර සිහිකිරීමයි !



Mr Parakrama Ranasinghe

ලන්ඩන් නගරයේ ශ්‍රී ලාංකික සමාජයේ ඉතා ජනප්‍රිය, එමෙන්ම කාගේත් සුහදශීලි මිත්‍රයෙකුව සිටි, '**පරා**' යන ආදර නාමයෙන් ඇමතුම් ලැබූ නීතිඥ **පරාක්‍රම රණසිංහ මහතා** අභාවප්‍රාප්තව පසුගිය මසට වසර **5** ක් පිරුණි.

ඒ වෙනුවෙන් රණසිංහ මහතාගේ අදරැති බිරිඳ මානෙල් සහ දරු පිරිසගේත්, හිතවතුන් රාශියකගේත් සහභාගිත්වයෙන් පිංකමක් සහ සාංඝික දානයක් ලන්ඩනයේ කිංස්බරි හි ශ්‍රී සද්ධාතිස්ස විහාරස්ථානයේ දී පැවැත්විණ.

පරා හිතවතාණන්ට සසර වසන තුරා අකල් මරණයකට නොපත්ව අවසන නිවන් සැප අත්වේවායි පතමු !

♦ ලංකාවිත්ති

# Record profits for Sri Lanka Distilleries

**Ramani Kangaraarachchi**

The Distilleries Company of Sri Lanka (DCSL) has recorded a consolidated profit of Rs 3.6 billion after minority interest in 2006/2007 despite the economy facing multiple challenges.

Chairman D. H. S. Jayawardena stated that although the Group through strategic acquisitions has diversified into many sectors inclusive of food and beverage, telecommunication, tourism, cargo, logistic, destination management, hotels and hotel management, plantations, fabric processing, garment, insurance and shipping, the beverage sector continues to be the main contributor towards Group's profit.

The Alcohol and Tobacco Bill passed in Parliament is at its infancy and will have major repercussions in the future he said.

He regretted that the National Authority on Tobacco Alcohol only focuses on the aspect of legal liquor that is least harmful and a major contributor to the SL economy.

# හරස්පද ප්‍රහේලිකා 93

**හරහට :**
1. යමක් දන්වන විදිය.
5. උඩු යන්නට විරුද්ධ පදය.
6. රසවත් ප්‍රබන්ධ
8. දුදනන්ගේ ඇඟ පුරාම ඇත
9. මේවා නිසා ඇස් රතුවේ.

**පහළට :**
2. වෙනස් නොවන.
3. සැරින් සැරේ.
4. මෙය නැතිව ගෙදර යා නොහැක.
6. බුදුන් උපන් ලග්නය. 7. අවුරුදු දහයේ කාල සීමා

| | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | | 4 |
| ■ | 5 | | ■ | |
| 6 | | | 7 | |
| | ■ | 8 | | ■ |
| 9 | | | | |

**ගියවර නිවැරදි විසඳුම්**

**හරහට:** 1 මදුලු 5 හීන්නාරන් 7 වස් 8 සාය 9 සාජා 11 කාවාඩි
**පහළට:** 1 මහී 2 දුන් 3 ලුනාව 4 දැන් 6 රස්සාව 8 සාපස 10 ජාඩි

# Happy Birthday! උපන් දින ශුභ පැතුම් !

මේ නොවැම්බර් මස **29** වෙනි දිනට පළමු වසරට පා තබන **දිල්හාන් යාපා අබේවර්ධන** පුතුට තිසරණ සරණින් ශුභ උපන්දිනයට ආසිරි පතනුයේ අදරැති අම්මා, තාත්තා, නැනා, ආශා, නිමාලි නැන්දලාත්, ගාමිණී හා ලාල් මාමලාත්, ට්‍රෝයි, මහීන්, හේසර අයියලා සමග නතායා අක්කා.



## ♥ පැටියො ඩාලිං



" පැටියො දැන් ලංකාවෙ ඉංග්‍රීසි මළපොතේ අකුරක් දන්නෙ නැති ඕනම කෙනෙකුට සති 3 කින් ඉංග්‍රීසි උගන්නලා ආචාර්‍ය උපාධියකුත් දෙනවලු. මේ එංගලන්තෙවත් එහෙම බැනේ. පුදුමයි නේද? "

" ඒක නෙවේ පුදුමෙ. අවුරුදු 30 ක් වෙලත් තවම ප්‍රභාකරන් ඉන්න තැන දන්නෙ නැති එක."

## නේක රසෙන් පිරිපුන් සිංහල ඉවුම් පිහුම්

# මනුෂ්‍යත්වය

## Humanity in culinary form

**අවශ්‍ය ද්‍රව්‍ය :**

| | |
|---|---|
| ආදරය | ග්‍රෑම් 250 යි |
| මිරිකාගත් දයාව කෝප්ප | 2 යි |
| බැගෑපත්කම තේ හැඳි | 2 යි |
| පරිත්‍යාගය ගෙඩි | 2 යි |
| ඉවසීම තේ හැඳි | 3 යි |
| කරුණාව මේස හැඳි | 3 යි |
| සිනහව මඳ පමණට | |
| හොඳ හිත අවශ්‍ය පමණට | |

**සාදන ක්‍රමය :** පළමුව ආදරය හොඳට සෝදා එහි ඇති වෛරය, පළිගැනීම හා ඊර්ෂ්‍යාව වැනි දෑ ඉවත් කරන්න.

ඊට පසු එම සෝදාගත් ආදරය භාජනයකට දමා එයට ඉවසීම හා කරුණාව එකතු කරන්න.

එයටම පරිත්‍යාගය ගෙඩි දෙක සිහින්ව කපා දමා බැගෑපත්කම හැඳි 2 කද එකතු කර, හොඳ හිත අවශ්‍ය පමණට දමා ලිප තබන්න.

ටික වේලාවකින් හොඳට මිරිකා ගත් දයාව කෝප්ප දෙකක්ද එක්කර හොඳින් මිශ්‍රවනසේ හැඳිගාන්න.

ඊළගට සිනහව ටිකෙන් ටික එක්කරමින් මදගින්නේ පිසගෙන ලිපෙන් බා අමුත්තන් වෙතට යවන්න.

මෙය නිවසේ ඕනෑම අවස්ථාවක ප්‍රයෝජනයට ගත හැකි එමෙන්ම නරක් නොවන, කල් තබාගත හැකි, සැම කෙනෙකුටම දිරවන රසවත් ආහාරයකි.

ඔබේ මනසද උදරය වැනිය. වැදගත් වන්නේ ඔබ එකතුකර ගන්නා දෙය නොව ඔබ දිරවා ගන්නා දෙයයි. ඔබේ මානසික සුවය ඇතිවන්නේ මනසට ඇතුල් කරන හොඳ ආහාර වලිනි. මෙම වට්ටෝරුවට මනුෂ්‍යත්වය යන නම දුන්නේ ඒ නිසා ය.

♦ සුජිත් ඉන්දික ජයසුන්දර Sri Lanka

Sam's CHICKEN CHICKEN CHICKEN
Great Tasting! Great Value!
සෑම්ස් චිකන්
17 HIGH STREET, WEALDSTONE, HARROW HA3 5BY, TEL: 020 8861 1872
439 HIGH ROAD, WILESDEN, LONDON NW10 2JJ, TEL: 020 8451 7662
84 HIGH STREET, HARLESDEN, LONDON NW10 42J, TEL: 020 8838 2036
246 KINGSBURY ROAD, KINGSBURY, LONDON NW9 9HN, TEL: 020 8204 1432